


# ස්වර්ණවාහිනිය ඔබේ නාළිකාවයි

## කැලුම් පාලිත මහීරත්න

*සාකච්ඡා කළේ ශ්‍රීනාත් මද්දුමගේ*

මෑතකදී අපට මෙල්බන් පුරවරයේදී දක්නට ලැබුණා චිත්‍රපටයක් තමයි නිලම්බරේ චිත්‍රපටය. එය නැරඹූ සෑම ප්‍රේක්ෂකයෙක්ම පාහේ එම චිත්‍රපටයේ රඟ පෑ නළු නිළියන් වගේම කැමරාකරණය, කලා අධ්‍යක්ෂණය. සංගීතය ඇතුළු සෑම දෙයක් ගැනම ඉතා ප්‍රශංසා මුඛයෙන් කතා කළා. ඒ හැමටම වැඩියෙන් විශේෂයක් වූයේ බොහෝ දෙනෙකු කියවා ඇති නවකතාවක් එය කියවන විට මැවෙන චිත්ත රූප ඒ අයුරින් නිර්මාණය කිරීමට තරුණ අධ්‍යක්ෂවරයෙකු වන කැළුම් පාලිත මහීරත්න ට හැකි වී තිබීම පැසසුම් කළ යුතු කරුණකි. නමුත් අද සන්නස සමඟ කෙටි පිළිසඳරකට ඔහු කැඳවා ගත්තේ චිත්‍රපටය ගැන කතා කිරීමට නොව එයට වඩා පුළුල් මාතෘකාවක් ගැන සාකච්ඡා කිරීමටයි. ශ්‍රී ලංකාව තුළ රූපවාහිණී නාළිකා විශාල ප්‍රමාණයක් තිබුණත් ශ්‍රී ලාංකේය අභිමානය යන තේමාව යටතේ වැඩ සටහන් මෙහෙයවන ස්වර්ණවාහිණී රූපවාහිණී ආයතනයේ විවිධ වැඩ වැඩ සටහන් අධ්‍යක්ෂක ලෙස කැළුම් පාලිත මහීරත්න්ගේ භූමිකාව අද අපි සාක්ච්ඡාවට ගනිමු.

***ස්වර්ණවාහිණියේ ඔබේ කාර්යභාරය..?***

ඇත්තෙන්ම මේ දවස් වල වැඩිපුර කාලය ගත කෙරෙන්නේ පරිපාලන කටයුතු සම්බන්ධවයි. ඊට අමතරව මා යටතේ ක්‍රියාත්මක වන සංගීත වැඩ සටහන්, විශේෂාංග වැඩ සටහන්, උදය විකාශණයේ වැඩසටහන්, අධීක්ෂණය වෙනවා.

***ස්වර්ණවාහිණී ආයතනය රටට මොන විදිහේ ප්‍රයෝජනයක් සඳහා ද මෙහෙයවන්නට අදහස් කරන්නේ..?***

අපේ සභාපතිනිය සෝමා එදිරිසිංහ මහතා සහ ජීවක එදිරිසිංහ මහතා ගේ අදහස් අනුව ස්වර්ණවාහිණී කාලයක් තිස්සේ ශ්‍රී ලාංකේය අභිමානය තේමාව යටතේ අපේ වැඩ සටහන් මෙහෙයවනවා.. වැඩියෙන්ම යොමු වෙලා තියෙන්නේ දේශීය කලාව සංස්කෘතිය ඔප් නැංවෙන වැඩ සටහන් නිර්මාණය කිරීමට.. ඊට අමතරව දේශීය කලා ශිල්පීන්ට සහ දේශීය කර්මාන්ත කරුවන්ට අත හිත දීමක් වශයෙනුයි.. එබැවින් ඔවුන්ගේ නිර්මාණ සහ ඔවුනක්ගේ අදහස් රටට බෙදා හැරීමට අපි වෙහෙසෙනවා..

***ශ්‍රී ලංකාව තුළ ටෙලි නාට්‍ය වලට විශාල බැඳීමක් තියෙනවා. ටෙලි නාට්‍ය සම්බන්ධයෙන් ඔබේ ආයතනය අනුගමනය කරන ක්‍රියා පටිපාටිය මොන වගේ එකක්ද?***

අපි හැම තිස්සේම උත්සාහ කරන්නේ තත්වයෙන් උසස් ටෙලි නාට්‍ය විකාශණය කිරීමටයි.. ඒ අනුව අපේ ටෙලි නාට්‍ය ගැනීමේදී හා විකාශණය කිරීමේ දී යම් යම් ප්‍රමිතකීන් අනුගමනය කරනවා.. ඒ වගේම ටෙලි නාට්‍ය විකාශණය කිරීමට බාර ගැනීමේ දී එම ටෙලි නාට්‍යය නැරඹීමට විශේෂඥයන්ගේන් සමන්විත සීක්ෂණ මන්ඩලයක් අපට සිටිනවා.. ඔවුන්ගේ තෝරා ගැනීම් අනුව තමයි අපි ඒවා විකාශණය කරන්නෙ..

***බෙහෝ වෙලාවට අපි දන්නවා ශ්‍රී ලංකාව තුළ දෙමළ සහ හින්දි ටෙලි නාට්‍ය හඬ කඩා විකාශණය වෙනවා. ඔබ ආයතනය මෙවැනි දේ කරන්න අදහස් කරන්නෙ නැද්ද?***

දැනට අපේ එහෙම බලාපොරොත්තුවක් නැහැ.. ඒ මොකද රූපවාහිණී නාළිකා වලඅ අපි දන්නනා තරගකාරී ස්වභාවයක් තිබෙන බව.. යම් යම් නාලිකා දෙමළ හා හින්දි ටෙලි නාට්‍ය හඬ කවා විකාශණය කරනවා.. ඒවායේ තියෙන අඩුපාඩු කතා කරන්න අපට අයිතියක් නැහැ.. ප්‍රේක්ෂකයන් හොඳ නරක තෝරාගෙන නරඹයි. එම ටෙලි නාට්‍ය විකාශණය වූවා යි කියා අපේ ආයතනයට කිසිම ප්‍රශ්ණයක් නැහැ.. වැඩි ප්‍රේක්ෂක ජනතාවක් අපත් සමඟ නිරන්තරයෙන් ම එකට ඉන්නවා..

මට හිතෙන හැටියට විදේශ ටෙලි නාට්‍ය මේ නාලිකා හරහා විකාශය වන්නට යම් හේතුවක් වූයේ අපේ නිර්මාණ වල යම් යම් අඩු ලුහුඬු කම් තිබුණ නිසා යි. නමුත් පවතින ක්‍රමයන් යටතේ අපටත් මේ සම්බන්ධ ව යම් යම් ක්‍රියාමාර්ග ගන්න සිද්ධ වෙනවා.. අපි මෑතකදී තීරණය කලා ශ්‍රී ලංකාවේ තරුණ නළු නිළියන් විශාල ප්‍රමාණයක් ඉන්දියාවට යවා රටවල් දෙකටම හරියන විශේෂාංග ටෙලිනාට්‍යයක් නිර්මාණය කිරීමට.. මේ දිනවල මා යටතේ එහි මූලික කටයුතු සැළසුම් කර තිබෙනවා..

***ඔබ ආයතනයේ විකාශණය වන වැඩසටහන් අපි වගේ පිටරට ජීවත් වන අයට ලබා ගැනීමට ක්‍රමයක් සැළසුම් කරන්නෙ නැද්ද..?***

ඇත්තටම මම මෙහි හිටපු කාලයෙදි ශ්‍රී ලාංකික වෙළඳසල් වලට ගොඩ වැදෙන විට දුටු කාරණයක් තමයි ශ්‍රී ලංකාව තුළ විකාශණය වන ටෙලි නාට්‍ය වලට විශාල ඉල්ලුමක් තිබෙන බව.. ඒ වගේම එම ඉල්ලුමෙන් වැඩි පුර ජනතාව ලබා ගන්නට උත්සාහ කරන්නෙ ස්වර්ණවාහිණී යේ විකාශනය වූ ටෙලි නාට්‍ය... ඒ ගැන මට සතුටුයි.. ඒ වගේම අපේ වැඩ සටහන් අධ්‍යක්ෂ හේම නලින් කරුණාරත් න මෙහෙයවන හංස විල ජැක්සන් ඇන්තනි මෙහෙයවන ගඟ දිගේ වැනි වැඩසටහන් වලට විශේෂ ඉල්ලුමක් තිබෙනවා..

***අපට එම නාට්‍ය සහ විවිධ වැඩ සටහන් වල පිටපත් ලබා ගැනීමට ක්‍රමයක් සැළසුම් කර නැද්ද..?***

ඇත්තටම මට ඔස්ට්‍රේලියාවට ආ විගසත් මම ඉතාලියේ කරපු සංචාරයෙදිත් හොඳින්ම දැක්ක දෙයක් තමයි මේ හැම කෙනෙක්ම හොඳ උසස් තත්වයේ පිටපත් ලබා ගැනීමට වැඩි උත්සාහයක් දරන බව. මම හිතනවා අපේ වැඩ සටහන් අධ්‍යක්ෂ තුමා සහ පරිපාලන නිළධාරීන් සමග සාකච්ඡා කර විදේශ රටවල් වලට හොඳ පිටපත් ලබාගැනීමට ක්‍රමයක් සැළසුම් කිරීමට.. නමුත් ප්‍රායෝගිකව යම් යම් ගැටලු වලට මුහුණ දෙන්නට ආයතනයක් හැටියට අපට සිදුවෙනවා.

***ඔස්ට්‍රේලියාවේ රූපවාහිනී නාලිකා ගැන ඔබේ අදහස.***

මම දැකපු එක දෙයක් තමයි රූපවාහිනී නාලිකා තුළ විශාල තරගයක් තිබෙනවා. නමුත් එක ආයතනයක් කරන වැඩ සටහනක් සාර්ථක වූ පමණින් අනිත් ආයතනත් එවැනි වැඩසටහන් කරන්නට සැළසුම් නොකරන බව.. අපේ රටේ තියෙන්නෙ ඒයිට වඩා වෙනස් තත්වයක්. ඒ කෙසේ වෙතත් අපේ ආයතනය එවැනි දේවල් නොකරන්නට වගබලා ගන්නවා. නමුත් මෙහිදී දැක්ක විශේස දේ තමයි හුඟාක් නාලිකා වල වැඩසටහන් සැළසුම් කරන්නේ ප්‍රේක්ෂකයන් වැඩිපුර සම්බන්ධ කරගන්නට හැකිවන ආකාරයටයි. විශේෂයෙන් ගෙල්ම් ෂෝ වගේ දේ. අපේ රටේ කරන්නට අපහසුම වැඩ සටහන් තමයි එවැනි වැඩසටහන්. ඒකට හේතුව තමයි සහභාගිවන ප්‍රේක්ෂකයන් මේ රටවල් වල වගේ ක්‍රියාශීලී ලෙස වැඩසටහනට බද්ධ නොවීම. එමෙන්ම ටෙලි චිත්‍රපට වලටත් හොඳ ඉල්ලුමක් තියෙනවා. වැඩි හරිය විකාශණය වෙන්නෙ ඇමරිකාවේ නිෂ්පාදනය වන ටෙලි චිත්‍රපට. නමුත් ඔස්ට්‍රේලියාවේ නිපදවන ටෙලි නාට්‍ය හැමවිටම සැළසුම් කරනු ලබන්නේ රටේ අනන්‍යතාවය සහ සංස්කෘතික ලක්ෂණ ආරක්ෂා වන අන්දමටයි. ඒ කෙසේ වෙතත් අඩු තාක්ෂණික මෙවලම් යටතේ අපේ රටේ නිෂ්පාදනය කරන වැඩසටහන් විශේෂයෙන් ටෙලි නාට්‍ය වැනි දේවල් මෙවැනිම උසස් මට්ටමක තිබෙනවා. ඒ ගැන මට සතුටුයි. නමුත් ළමා වැඩසටහන් වලට මෙහි ලැඅබෙන්නේ ප්‍රමුඛ ස්ථානයක්. ළමයින්ගේ අධ්‍යාපනය හැකියාවන් කුසලතා ඔප් නැංවීමට තමයි සියලුම ළමා වැඩසටහන් සැළසුම් කරනු ලබින්නේ. මමත් බලාපොරොත්තු වෙනවා මේ ටික කාලයට දුටු බොහෝ දේ කැටි කොටගත් ළමා වැඩසටහන් කීපයක් නිර්මාණය කිරීමට.

සාර්ථක වාණිජ සිනමාවක් කරා යාමේ ගමනේ දී ඔබේ නිලම්බරේ චිත්‍රපටය කඩඉමක් වූ බවට සැකයක් නැහැ. ප්‍රේක්ෂකයන් විශාල සංඛ්‍යාවක් කියවූ දිර්ෂ නවකතාවක් ප්‍රේක්ෂකයන්ගේ රසාස්වාදයට හානි නොවන ආකාරයට සිනමා කෘතියකට නැගීමේ අපහසු කර්තව්‍යය ඔබ ජයගෙන තිබෙන බව ප්‍රේක්ෂක ප්‍රතිචාර පෙන්නුම් කරනවා. ඒ එක්කම ඔබගේ රූප රාමුවල ඇති නැවුම් බව සහ චමත්කාරය පිලබඳව මෙහි ප්‍රේක්ෂකයන් තවමත් කතා කරනු අපට ඇසෙනවා. ඔබේ සිනමා දිවිය සහ ස්වර්ණවාහිණියේ විවිධ වැඩසටහන් අධ්‍යක්ෂ ලෙස කරගෙන යන කටයුතු සියල්ල සාර්ථක වේවායි සන්නස වෙනුවෙන් අපි ප්‍රාර්ථනා කරනවා.